1 පත්‍රයට අදාළ පසුගිය විභාග ගැටළු

## 10 ශ්‍රේණිය

## 2 වන පාඩම - පරිගණකය හඳුනාගනිමු.

### අ.පො.ස.(සා.පෙළ) 2016

1. පහත දී ඇති උපක්‍රම (devices) සලකන්න:
   A - මූසිකය
   B - ස්පර්ශ තිරය
   C - ලිවිය හැකි බාහිර DVD ධාවකය
   ඉහත කුමන උපක්‍රම ආදාන සහ ප්‍රතිදාන යන දෙක ම සඳහා භාවිතා කළ හැකි ද?
   (1) A සහ B පමණි (2) A සහ C පමණි (3) B සහ C පමණි (4) A, B, Cසියල්ල ම

2. පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න:
   A - ප්‍රකාශ තන්තු රැහැන්වල දත්ත හුවමාරු වේගය තඹ රැහැන්වල දත්ත හුවමාරු වේගයට වඩා වැඩි වේ.
   B - තඹ රැහැන්වල දත්ත හුවමාරු වේගය ප්‍රකාශ තන්තු රැහැන්වල දත්ත හුවමාරු වේගයට වඩා වැඩි වේ.
   C - තඹ රැහැන්වල මිල ප්‍රකාශ තන්තු රැහැන්වල මිලට වඩා වැඩි වේ.
   ඉහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේ ද?
   (1) A පමණි (2) B පමණි (3) A සහ C පමණි (4) B සහ C පමණි

### අ.පො.ස.(සා.පෙළ) 2017

3. පහත සඳහන් කුමන සන්නිවේදන මාධ්‍ය ආලෝක පරාවර්තනය කිරීම මගින් දත්ත සම්ප්‍රේෂණය සිදු කරයි ද?
   (1) නොවැසුණු ඇඹරූ කම්බි යුගල (UTP) (2) ප්‍රකාශ තන්තු (Optical fiber)
   (3) සමාක්ෂ කේබල (Coaxial cables) (4) වැසුණු ඇඹරූ කම්බි යුගල (STP)

4. සමහර උපක්‍රම (devices) ආදාන (input) හෝ ප්‍රතිදාන(output) ලෙස පමණක් ක්‍රියා කරන අතර, තවත් සමහරක් ආදාන සහ ප්‍රතිදාන යන දෙයාකාරයටම ක්‍රියා කරයි. පහත සඳහන් ඇ අතුරෙන් කවරක් ප්‍රතිදාන උපක්‍රම ලෙස පමණක් ක්‍රියා කරයි ද?
   (1) ස්පර්ශක තිරය (touch screen display) සහ සුපරීක්සකය(scanner)
   (2) මුද්‍රණ යන්ත්‍රය සහ වෙබ් කැමරාව
   (3) මුද්‍රණ යන්ත්‍රය සහ ස්පීකරය (speaker)
   (4) ස්පර්ශක තිරය (touch screen display) සහ තීරු කේත කියවනය (barcode reader)

### අ.පො.ස.(සා.පෙළ) 2018

5. පරිගණකයක් තුළ ‘කල් පවතින සේ’ දත්ත ආචයනය (store) කිරීමට යෝග්‍ය වන්නේ පහත සඳහන් කුමක් ද?
   (1) නිහිත මතකය (cache memory) (2) දෘඪ තැටිය
   (3) සසම්භාවී ප්‍රවේශ මතකය (RAM) (4) වීඩියෝ මතකය

6. ආදාන උපක්‍රම (input devices) **පමණක්** දැක්වෙන්නේ පහත කවරක ද?
   (1) යතුරු පුවරුව, තීරුකේත කියවනය (barcode reader), CD ROM, සමතල සුපරීක්සකය (flatbed scanner)
   (2) යතුරු පුවරුව, වෙබ් කැමරාව, ස්පර්ශ තිරය (touch screen), සමතල සුපරීක්සකය
   (3) මූසිකය, යතුරු පුවරුව, ස්පර්ශ තිරය, සමතල සුපරීක්සකය
   (4) මූසිකය, වෙබ් කැමරාව, ස්පර්ශ තිරය, සමතල සුපරීක්සකය

7. පරිගණකයේ මධ්‍ය සැකසුම් ඒකකයෙහි හෝරා වේගය (clock speed) මැනීමට භාවිත කළ හැක්කේ පහත සඳහන් කවරක් ද?
   (1) ගිගාබයිට (GB) (2) ගිගාහර්ට්ස් (GHz)
   (3) තත්පරයට මෙගාබිටු (Mbps) (4) මිනිත්තුවට පරිභ්‍රමණ (RPM)

8. තඹ රැහැන්, ආලෝක පරාවර්තනය සහ රේඩියෝ තරංග තුළින් දත්ත සම්ප්‍රේෂණය කිරීමට වඩාත් ම යෝග්‍ය මාධ්‍ය පිළිවෙළින් ඇතුළත් ලැයිස්තුව කුමක් ද?
   (1) ප්‍රකාශ තන්තු, ඇඹරි යුගල, වයිෆයි (2) ප්‍රකාශ තන්තු, වයිෆයි, ඇඹරි යුගල
   (3) ඇඹරි යුගල, ප්‍රකාශ තන්තු,වයිෆයි (4) ඇඹරි යුගල, වයිෆයි, ප්‍රකාශ තන්තු

අ.පො.ස.(සා.පෙළ) 2019

9. ආදාන හා ප්‍රතිදාන හැකියාවන් දෙකම පවතින්නේ පහත සඳහන් කවර උපක්‍රමයක ද?
   (1) මෙහෙයුම් යටිය (joystick)
   (2) ප්‍රකාශ අනුලක්ෂ කියවනය (OCR)
   (3) ස්පර්ශ තිරය
   (4) වෙබ් කැම් (webcam)

10. සුපිරි පරිගණක, උකුළු පරිගණක හා ටැබ්ලට් පරිගණක අතුරෙන් පහත සඳහන් යෙදුම් අවස්ථා සඳහා වඩාත්ම යෝග්‍ය පරිගණක ප්‍රරූපය තෝරන්න.
    A - චන්ද්‍රිකා මගින් අඛණ්ඩව ලබා ගන්නා අති විශාල දත්ත ප්‍රමාණයක් සැකසීමට
    B - තම නිවසින් බැහැරව නිවාඩුව ගත කරන ලේඛකයකුට රචනාවක් ලිවීම සඳහා
    C - ලැබෙන අයිතම ඉල්ලීම් ඇතුළත් කිරීමට වෙළඳසැල්වලට පැමිණෙන ජංගම වෙළඳ නියෝජිතයෙකුගේ භාවිතය සඳහා
    (1) A : උකුළු පරිගණක, B : සුපිරි පරිගණ, C : ටැබ්ලට් පරිගණක
    (2) A : උකුළු පරිගණක, B : ටැබ්ලට් පරිගණක, C : සුපිරි පරිගණක
    (3) A : සුපිරි පරිගණක, B : උකුළු පරිගණක, C : ටැබ්ලට් පරිගණක
    (4) A : ටැබ්ලට් පරිගණක, B : සුපිරි පරිගණක, C : උකුළු පරිගණක

11. A හා B හිස්තැන් සහිත පහත ප්‍රකාශය සලකන්න:
    සැකසීම් (processing) කාර්යය කරන විට මධ්‍ය සැකසුම් ඒකකය එහි ...........A.............. භාවිත කරන්නේ, .............B.............. ගෙන එන ලද දත්ත තාවකාලිකව ආචයනය කිරීම සඳහා ය.
    ඉහත හා හිස්තැන් පිළිවෙළින් පිරවීම සඳහා පහත දක්වා ඇති කුමන සංයෝජනයක් යෝග්‍ය වන්නේ ද?
    (1) ප්‍රාථමික මතකය, රෙජිස්තරවලින් (2) රෙජිස්තර, ප්‍රාථමික මතකයෙන්
    (3) ද්විතීයික මතකය, ප්‍රාථමික මතකයෙන් (4) ද්විතීයික මතකය, රෙජිස්තරවලින්

12. සම්ප්‍රේෂණ මාධ්‍ය සම්බන්ධයෙන් පහත කවරක් නිවැරදි වන්නේ ද?
    A – 200 m ඉක්මවන දිගු දුරකට දත්ත සම්ප්‍රේෂණය සඳහා නොවැසුණු ඇඹරි යුගල (UTP) කේබල සුදුසු වේ.
    B - ප්‍රකාශ තන්තු කේබලවල දත්ත සම්ප්‍රේෂණය UTP කේබලවලට වඩා වේගවත් වේ.
    C - රැහැන් රහිත යතුරු පුවරු හා පරිගණක අතර සන්නිවේදනය සඳහා අධෝරක්ත දත්ත සම්ප්‍රේෂණය යොදා ගැනේ.
    (1) B පමණි (2) C පමණි (3) B හා C පමණි (4) A, B හා C සියල්ලම

අ.පො.ස.(සා.පෙළ) 2020

13. ආදාන උපක්‍රම (input devices) පමණක් අඩංගු වන්නේ පහත සඳහන් කවරක ද?
   (1) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය (Multimedia projector), මුද්‍රණ යන්ත්‍රය, යතුරු පුවරුව, මූසිකය
   (2) මුද්‍රණ යන්ත්‍රය, යතුරු පුවරුව, ස්පර්ශක තිරය, මෙහෙයුම් යටිය (Joystick)
   (3) පරිගණක තිරය, ආලෝක පෑන, බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය, යතුරු පුවරුව
   (4) මූසිකය, යතුරු පුවරුව, ආලෝක පෑන, මෙහෙයුම් යටිය

14. පරිගණක පද්ධතියත ද්විතීයික මතකය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත සඳහන් කවරක් ද?
   A. පරිගණකය ක්‍රියාවිරහිත කළ ද (switched off) දත්ත මැකී නොයයි.
   B. ඝන අවස්ථා උපක්‍රම (solid state devices) ද්විතීයික මතකය සඳහා භාවිතා කළ හැකිය.
   C. ද්විතීයික මතකය, CPU මතකයේ කොටසකි.
   (1) A හා B පමණි.   (2) A හා C පමණි.
   (3) B හා C පමණි.   (4) A, B හා C සියල්ලම

15. පහත සඳහන් කවර ජාල ස්ථලකයක් (topology) මගින් සෑම පරිගණකයක්ම, තවත් පරිගණක දෙකක් හා **හරියටම** සම්බන්ධ කරනු ලබන්නේ ද?
   (1) බස් (bus)   (2) මුදු (ring)   (3) බැඳි (mesh)   (4) තාරකා (star)

අ.පො.ස.(සා.පෙළ) 2021

16. පහත සඳහන් කවර කාණ්ඩයක් ආදාන උපක්‍රමවලින් පමණක් සමන්විත වන්නේ ද?
   (1) තීරු කේත කියවනය (Barcode Reader), කැතෝඩ කිරණ නළය සහිත තිරය (CRT Monitor), මෙහෙයුම් යටිය (Joystick)
   (2) තීරු කේත කියවනය, ලකුණුකරණය (Plotter), වෙබ් කැමරාව
   (3) යතුරු පුවරුව, මූසිකය, සුපිරික්සකය (Scanner)
   (4) බහු-මාධ්‍ය ප්‍රක්ෂේපකය (Multimedia Projector), මුද්‍රකය (Printer), සුපිරික්සකය

17. දත්ත ස්ථිර වශයෙන් ආචයනය (store) කිරීම සඳහා පහත සඳහන් දෑ අතුරෙන් කවරක් භාවිත කළ **නොහැකි** වන්නේ ද?
   (1) දෘඪ ඩිස්කය   (2) චුම්බක පටිය (Magnetic tape)
   (3) සසම්භාවී ප්‍රවේශ මතකය (RAM)   (4) සැනෙළි මතකය (USB Flash Drive)

18. .................................. ආකාරයේ ජාල ස්ථලකයකදී, එහි වූ සෑම ජාල සංරචකයක්ම නාභියක් (hub) හෝ ස්විචයක් වැනි මධ්‍ය මංසලකට (node) භෞතිකව සම්බන්ධව පවතී.
(1) බසයක (bus)   (2) දැලක (mesh)   (3) මුදුවක (ring)   (4) තාරුකාවක (star)

අ.පො.ස.(සා.පෙළ) 2022

19. පාසලකට පරිගණක උපකරණ පරිත්‍යාග කිරීමට සංගමයක් මනාපය පළකර ඇත. පාසල තම පුස්තකාල කළමනාකරණ පද්ධතිය ගොඩනැගීමට සැලසුම් කරයි නම්, පහත කුමන දෘඪාංග පාසල සංගමයෙන් ඉල්ලා සිටීම සුදුසු ද?

   (1) මේස (desktop) පරිගණකයක්, තීරු කේත කියවනයක් (barcode reader)
   (2) මේස පරිගණකයක්, ලකුණු කරනයක් (plotter)
   (3) උකුළු පරිගණකයක් (laptop), මෙහෙයුම් යටියක් (joystick)
   (4) උකුළු පරිගණකයක්, ආලෝක පෑනක් (light pen)

20. **ප්‍රතිදාන** (output) උපකරණ පමණක් දැක්වෙන්නේ පහත කුමන ලැයිස්තුවේ ද?

(1) තීරු කේත කියවනය, චුම්බක තීන්ත අනුලක්ෂණ කියවනය (magnetic ink character reader), සුපිරික්සකය (scanner)

(2) මෙහෙයුම් යටිය, මයික්‍රොෆෝනය, වෙබ් කැමරාව

(3) යතුරු පුවරුව, ආලෝක පෑන, මූසිකය (mouse)

(4) ලකුණු කරනය, ප්‍රක්ෂේපකය (projector), ස්පීකරය



21. පෙන්වා ඇති උපකරණයට සමාන උපකරණයක් වාස්තු විද්‍යාඥයන් (architects) විසින් සාමාන්‍යයෙන් භාවිත කෙරේ. එය කුමක්ද?

(1) තිත් න්‍යාස (dot-matrix) මුද්‍රකය

(2) තීන්ත විදුම් (inkjet) මුද්‍රකය

(3) බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය (multimedia projector)

(4) ලකුණු කරනය (plotter)

22. පරිශීලකයකු පරිගණක **ක්‍රමලේඛයක්** ක්‍රියාකරවූ විට (execute) උපදෙස් (instruction) ගැලීමේ නිවැරදි අනුපිළිවෙළ පහත කවරකින් දැක්වේ ද?

(1) දෘඪ ඩිස්කය → නිහිත (cache) මතකය → ප්‍රධාන මතකය → රෙජිස්තර

(2) දෘඪ ඩිස්කය → ප්‍රධාන මතකය → නිහිත මතකය → රෙජිස්තර

(3) ප්‍රධාන මතකය → දෘඪ ඩිස්කය →→ රෙජිස්තර → නිහිත මතකය

(4) රෙජිස්තර → දෘඪ ඩිස්කය →→ නිහිත මතකය → ප්‍රධාන මතකය

23. අන්තර්ජාලය හා සම්බන්ධ පරිගණක ජාලයක් පහත රූපයේ පෙන්වයි.
පහත කුමන ලැයිස්තුවේ A-D උපක්‍රම (devices) නිවැරදිව දැක්වේද?




(1) A - ගිනිපවුර (firewall, B - ස්විචය, C - මුද්‍රකය, D - මංහසුරුව (router)

(2) A - ගිනිපවුර, B - මුද්‍රකය, C - මංහසුරුව, D - ස්විචය

(3) A - මං හසුරුව, B - ගිනිපවුර, C - ස්විචය, D - මුද්‍රකය

(4) A - මංහසුරුව, B - ස්විචය, C - මුද්‍රකය, D - ගිනිපවුර

පිළිතුරු

| | | | | |
|---|---|---|---|---|
| (1) 3 | (2) 1 | (3) 2 | (4) 3 | (5 ) 2 |
| (6) 1 | (7) 2 | (8) 3 | (9) 3 | (10) 3 |
| (11) 2 | (12) 3 | (13) 4 | (14) 1 | (15) 2 |
| (16) 3 | (17) 3 | (18) 4 | (19) 1 | (20) 4 |
| (21) 4 | (22) 2 | (23) 3 | | |